# ලංකා විදුලිබල මණ්ඩලය
## ඌව පළාත

**ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීම් අංශය 03ට අයත් ඌව පළාත සඳහා 2021 වර්ෂයට භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

2021 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඌව පළාත) විසින් පහත සඳහන් යොමු අංකයන් යටතේ භාණ්ඩ හා සේවා සැපයීමට කැමති පිළිගත් භාණ්ඩ නිපදවන්නන්, බෙදාහරින්නන්, නියෝජිතයන්, සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඌව පළාත තුල පහත සඳහන් ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු ඒකකයන් හා ප්‍රධාන ඉංජිනේරු තැනීම් ඒකකය, ප්‍රධාන ඉංජිනේරු බෙදාහැරීම් නඩත්තු ඒකකය, ප්‍රධාන ඉංජිනේරු සැලසුම් හා සංවර්ධන ඒකකය යන ඒකකයන් අයත් වේ.

- ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය - බදුල්ල
- ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය - දියතලාව
- ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය - මොණරාගල
- ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය - මහියංගනය

සටහන : 2020 වර්ෂයේදි ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් 2021 වර්ෂයට ලියාපදිංචි වීම සඳහා අලුතින් අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

<u>අයිතම වර්ගය</u>

**(A)** <u>භාණ්ඩ</u>

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/01

ඌව පළාත සඳහා 2021 වර්ෂයට භාණ්ඩ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

| භාණ්ඩ සංකේතය | භාණ්ඩ වර්ගය |
|---|---|
| M-01 | MCCB, MCB, ELCB, RCCB, කටවුට්ස්, පුළුස්සු පුරුක් ,HRC පුළුස්සු, පුළුස්සු රඳවන, නියුට්‍රල් පුරුක්, තඹ බැර යටි, තඹ කෙවුන්, තෙරපි බහන් කෙවුන් දෙලෝහ හා Exothermic welding සඳහා අවශ්‍ය ද්‍රව්‍ය. |
| M-02 | සියළුම රැහැන් උපාංග |
| M-03 | විදුලි උපකරණ. හැලජන් ලාම්පු ගැලපි, විථි ලාම්පු හා ගැලපී, ප්‍රධාන වහරු හා අනෙකුත් විදුලි උපාංග |
| M-04 | වීදුලි ආරක්ෂිත උපකරණ, ආරක්ෂිත ඇඳුම් පැලඳුම්, ආයුධ, මැනිම් උපකරණ, ඉනිමං යනාදිය |
| M-05 | සියළුම වර්ගයේ තඹ හා ඇලුමිනියම් වෙනුල තත් තඹ හා ඇලුමිනියම් පිරියවන හා බැඳුම් තත් |
| M-06 | යටිබහන් සඳහා උපාංග හා පිරිද්දුම් බඩු බාහිරාදිය සහ සියලුම වර්ගයේ වෙනුල පටි |
| M-07 | මනුරූ පෙට්ටි (PVC), යකඩ පෙට්ටි, මනුරූ පුවරු |
| M-08 | ලිපිද්‍රව්‍ය |
| M-09 | මෝටර් රථ සඳහා ටයර් හා ටියුබ් |
| M-10 | පරිගණක, ප්‍රින්ටර්, දත්ත ජාල උපාංග හා අනෙකුත් උපාංග |

***අනු අංක 01-10 දක්වා වෙන වෙනම ටෙන්ඩර් පොත් මගින් අයදුම් කල යුතුය.**

**(B) <u>සේවා</u>**

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/02

ඌව පළාත සඳහා 2021 වර්ෂයට සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

| **සේවා සංකේතය** | **සේවා වර්ගය** |
|---|---|
| S-01 | ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා , විදුලිය සිඳලීම් සේවා, අධික්ෂණ සහතික ලබාගැනීම සඳහා වරලත් විදුලි ඉංජිනේරුවරුන්ගේ සේවා , මිනුම් උපකරණ (Clip-on Meters, Crimping tools etc.) ක්‍රමාංකණය කිරීමේ පරික්ෂණාගාර සේවා |
| S-02 | වාහන සේවා කිරීම හා අලුත්වැඩියා කිරීම |
| S-03 | විදුලි බිල්පත්, ආකෘති පත්‍ර, අත් පත්‍රිකා හා වෙනත් මුද්‍රණ කටයුතු |
| S-04 | ලී කණු , වැරකැවු සහ පෙරසවි කොන්ක්‍රිට්,කණු, ට්‍රාන්ස්ෆෝමර්ස් හා අනෙකුත් භාණ්ඩ ප්‍රවාහනය |
| S-05 | සිවිල් වැඩකටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්, සිවිල් ඉංජිනේරුවරුන්ගේ උපදේශන සේවාව ලබාගැනීම |

***අනු අංක 01-05 දක්වා වෙන වෙනම ටෙන්ඩර් පොත් මගින් අයදුම් කල යුතුය.**

**(C) කොන්ක්‍රීට් කණු**

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/03

ඌව පළාත සඳහා 2021 වර්ෂයට වරකැවු කොන්ක්‍රිට් කණු සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/04

ඌව පළාත සඳහා 2021 වර්ෂයට පෙරදි/පෙරදි ස්පන් කොන්ක්‍රිට් කණු සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

*පෙරදි කොන්ක්‍රිට් කණු හා පෙරදි ස්පන් කොන්ක්‍රිට් කණු සඳහා වෙනම ටෙන්ඩර් පොත් ඉදිරිපත් කල යුතුය.

**(D) කොන්ත්‍රාත් කාර්යයන්**

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/05

ඌව පළාත සඳහා 2021 වර්ෂයට සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

*ප්‍රාදේශිය විදුලි ඉංජිනේරු කාර්යාල සඳහා වෙන වෙනම ටෙන්ඩර් පොත් ඉදිරිපත් කල යුතුය.

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/06

ඌව පළාත සඳහා 2021 වර්ෂයට විදුලි මාර්ග උපපොල තැනීම් හා නඩත්තු කටයුතු සඳහා සැපයුම්කරුවන්

ලියාපදිංචි කිරිම.
*ප්‍ර.ඉ (තැනිම්) හා ප්‍ර.ඉ (බෙදාහැරීම් නඩත්තු) සඳහා වෙන වෙනම ටෙන්ඩර් පොත් ඉදිරිපත් කල යුතුය.

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/07
ඌව පළාත සඳහා 2021 වර්ෂයට අධිසැර/ අඩුසැර විදුලි මාර්ග හා උපපොල අවට මංවර හෙළිකිරිම සඳහා
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම.
*ප්‍රාදේශිය විදුලි ඉංජිනේරු කාර්යාල සඳහා වෙන වෙනම ටෙන්ඩර් පොත් ඉදිරිපත් කල යුතුය.

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/08
ඌව පළාත සඳහා 2021 වර්ෂයට අඩුසැර විදුලි මාර්ග නඩත්තු කටයුතු සඳහා
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම.

යොමු අංකය : DGM(Uva)/CE(Com)/SupReg2021/09
ඌව පළාත සඳහා 2021 වර්ෂයට මධ්‍යම වෝල්ටීයතා විදුලි මාර්ග නඩත්තු කටයුතු සඳහා
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම.

**<u>පොදු කොන්දේසි</u>**

අදාළ අයදුම්පත් 2020.10.22 දින සිට 2020.11.11 දින දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව), ප්‍රධාන ඉංජිනේරු වාණිජ ඒකකය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක. 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ බදුල්ල කාර්යාලයෙන් සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 03.00 තෙක් කාලය තුල ලබාගත හැක. අදාළ එක් එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 500/-ක වටිනාකමකින් යුතු සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය නමට ලියන ලද බැංකු අණකරයක් හෝ ප්‍රධාන ඉංජිනේරු වාණිජ ඒකකයෙන් නිකුත් කරනු ලබන ගෙවීම් වවුචරයක් මඟින් ගෙවීම් කල යුතුය.

නියමිත පරිදි සම්පුර්ණ කරන ලද අයදුම්පත් ප්‍රධාන ඉංජිනේරු වාණිජ ඒකකය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක. 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ බදුල්ල යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් 2020.11.11වන දින ප.ව. 03.00පෙර ලැබෙන පරිදි එවීමට හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කල යුතුය. අයදුම්පත සහිත ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ යොමු අංකය සඳහන් කර "සැපයුම් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021" ලෙස සඳහන් කල යුතුය.

භාණ්ඩ, සේවා සැපයීම් හා කොන්ත්‍රාත් කටයුතු සඳහා ලියාපදිංචි වීමට කැමති අයදුම්කරුවන් එම එක් එක් යොමු අංකයන් සඳහා වෙනවෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතුවේ.

තැන්පත් මුදල් ගෙවීම් කළ යුතු ආකාරය, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සහ කොන්දේසි අයදුම්පත් සමඟ සපයනු ලැබේ.

2020.11.11 වන දින ප.ව. 03.00 න් පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ඒවා විවෘත කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව),
ප්‍රධාන ඉංජිනේරු වාණිජ ඒකකය,
ලංකා විදුලිබල මණ්ඩලය,
අංක. 04, ස්ප්‍රිංවැලි පාර,
හිඳගොඩ
බදුල්ල

දුරකථන : **055 – 4929704**   ෆැක්ස් : **055 – 2222394**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලිබලයෙන් සසිරිමත් දිවියක්